# බැඳීම #13

| **ප්‍රාදේශීය සේවා සැපයුම වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාදේශීය සභා තුළ පුරවැසි සහභාගිත්වයෙන් යුත් කමිටු ශක්තිමත් කිරීම** | |
|---|---|
| 2019 මාර්තු 01 – 2021 අගෝස්තු 31 | |
| ක්‍රියාත්මක කිරීමේ දි මූලික වන ආයතනය/ පුද්ගලයා | **පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය** |
| **බැඳීම පිළිබඳ විස්තරය** | |
| බැඳීම මගින් අවධානයට ලක්කරන්නා වූ මහජන ගැටළුව කුමක්ද? | ප්‍රාදේශීය සභා යනු රජයේ පළාත් පාලන පද්ධතිය තුළ පුළුල් පරාසයක මහජන සේවාවන් සපයන වැදගත් ආයතනික ව්‍යුහයකි. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත මගින් ප්‍රාදේශීය සභා කමිටු පිහිටුවීමටත් එමගින් තීරණ ගැනීමේ ක්‍රියාවලියේදි පුරවැසියන්ගේ සහභාගීත්වය ලබා ගැනීමටත් ඉඩ සලසා ඇත. කෙසේ වුවද වර්තමානයේ දී මෙම අවස්ථාව සභාව මගින් හෝ පුරවැසියන් විසින් උචිත ආකාරයෙන් උපයෝගී කර නොමැත. පුරවැසියන් බොහෝ දෙනෙක් තීරණ ක්‍රියාවලියෙන් තමන් බැහැර කර ඇතැයි සලකන අතර තමන් ලබන සේවාව පිළිබඳ තෘප්තිමත් නොවේ. මීට අමතරව තම ප්‍රදේශවල මතුවන විවිධ ගැටළු නිරාකරණය කිරීමට සහ ප්‍රාදේශීය සභාවල මූලික කාර්යභාරයන් පහසු කරලීම සඳහා අතිශයින් වැදගත් මෙවලම් වන අතුරු නියෝග ද ප්‍රමාණවත් ලෙස පනවා නොමැත. |
| බැඳීම කුමක්ද? | ප්‍රාදේශීය සභා සමග එක්ව කටයුතු කිරීමෙන් වඩා හොඳ ප්‍රතිපත්තීන් වෙනුවෙන් පෙනී සිටීමටත් ප්‍රාදේශීය මට්ටමින් සේවා සැපයීම වැඩි දියුණු කිරීමටත් පුරවැසියන් තුල ඇති හැකියාව වර්ධනය කිරීම මෙම බැඳීමෙහි අරමුණ වේ.ශ්‍රී ලංකාවේ බහුතර පුරවැසියන් ජීවත් වන්නේ ප්‍රාදේශීය සභා සීමාවන් තුල බැවින් ඔවුන්ගේ සහභාගීත්වයෙන් ප්‍රාදේශීය සභා කමිටු පද්ධති ශක්තිමත් කිරීමේ විශාල වැදගත්කමක් පවතී. මෙම කමිටු සඳහා සහභාගී වීම හරහා සභාව හා පුරවැසියන් අතර විධිමත් සහ නිරන්තර සාකච්ඡා මාර්ගයක් නිර්මාණය වීමට ඉඩකඩ සැලසේ. මෙවැනි වාතාවරණයක් තිබීම, තම ප්‍රජාවේ අවශ්‍යතාවයන් වෙත පුළුල් අවධානයක් යොමු කිරීමටත් අයවැය සැලසුම්කරණයේ දි හා ව්‍යාපෘති සැකසීමේ දි එම ක්‍රියාවලියට සම්බන්ධ වීමටත් පුරවැසියන්ට ඉතා ප්‍රයෝජනවත් වේ. තවද, සභාවේ පරිපාලන කටයුතු සාකච්ඡා කිරීමටත් එමගින් සභාවේ කාර්යක්ෂමතාවය සහ කාර්ය සාධනය වැඩිකිරීමටත් කමිටු රැස්වීම් දායක වේ. |
| මෙම මහජන ගැටළුව විසඳීම සඳහා හඳුනාගත් බැඳීම දායක වන්නේ කෙසේද? | බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක 3ම නියෝජනය වන පරිදි ප්‍රාදේශීය සභා 6ක් නියමු සභාවන් ලෙස තෝරා පුරවැසි සහභාගීත්වයෙන් කමිටු ස්ථාපනය කෙරෙනු ඇත. මෙම කමිටු ඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සඳහා දැනුවත් කිරීම, තාක්ෂණික සහය හා නිපුණතාවයන් ලබා දෙනු ඇත. අවශ්‍ය අතුරු නීති උපරිමයෙන් 5ක් සහභාගීත්ව ප්‍රවේශයක් හරහා හඳුනා ගෙන කෙටුම්පත් කෙරෙනු ඇත. බස්නාහිර පළාතේ පළාත් සභා මට්ටමෙන් ප්‍රජා මණ්ඩල ශක්තිමත් කිරීම සඳහා ව්‍යවස්ථාවක් සැකසෙනු ඇත. අනෙකුත් ප්‍රාදේශීය සභා, නගර සභා හා මහ නගර සභාවල මෙම අත්දැකීම් ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සහය ලබා දීමට යාන්ත්‍රණයක් සැකෙසනු ඇත. එබැවින් ප්‍රාදේශීය සභාවල පුරවැසි සහභාගීත්වෙයන් යුත් කමිටු පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා දැඩි අවශ්‍යතාවයක් පවතින අතර ව්‍යාපෘති නිමකිරීමේ සාර්ථකත්වය සමගම නගර සභා හා මහනගර සභාවල ද එම ක්‍රියාවලිය වැඩි පරිමාණයකින් ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් සැලසේ. |
| මෙම බැඳීම විවෘත රාජ්‍ය හවුල්කාරිත්ව අගයන්ට අදාළ වන්නේ ඇයි? | ප්‍රාදේශීය සභාවන්හි තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී නිරන්තරයෙන්ම පුරවැසියන් සහභාගි වන බැවින් මෙම බැඳීම හරහා **පුරවැසි සහභාගීත්වය** වර්ධනය වේ. එමෙන්ම සභාවේ ක්‍රියාකාරකම්, වැය විස්තර, ආදායම් එකතු කිරීම වැනි කරුණු පිළිබඳව පුරවැසියන් දැනුවත්වන බැවින් මෙමගින් **විනිවිදභාවය** වර්ධනය වේ. |
| අමතර විස්තර | මෙම බැඳීම මගින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කෙරේ. එමෙන්ම රට තුල පවතින තොරතුරු දැනගැනීමේ නීතිය ද මේ සඳහා පිටුවහලක් වේ. |

| බැඳීම සපුරාලීම සඳහා ඉලක්කගත ක්‍රියාකාරකම් | ආරම්භක දිනය: | අවසන්වන දිනය: |
|---|---|---|
| 1. බස්නාහිර පළාත තුල දිස්ත්‍රික්ක 3ම නියෝජනය වන පරිදි නියමු ප්‍රාදේශීය සභා 6ක් තෝරාගෙන එම සභාවල සාමාජිකයන් සහ පුරවැසියන් තුළ සභා කමිටු පද්ධතිය පිළිබඳ මූලික දැනුමක් ඇති කෙරේ. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන මගින් සභා කමිටුවල පුරවැසි සහභාගීත්ව ධාරිතාවය නිරූපණය වේ. | 2019 මැයි | 2019 අගෝස්තු |
| 2. පුරවැසි නියෝජනයෙන් යුත් කමිටු නියමු සභාවල ස්ථාපිත වේ. කමිටුවල ඵලදායී ක්‍රියාකාරීත්වය සඳහා තාක්ෂණික සහය හා කුසලතාවයන් බාහිර සම්පත්දායකයන් මගින් ලබා දෙනු ඇත. | 2019 අගෝස්තු | 2020 අගෝස්තු |
| 3. සභා කමිටුවල අදහස් විමසීමෙන් යුතුව උපරිම වශයෙන් අතුරු නීති 5ක් සකසනු ඇත. බාහිර උපදේශකවරයෙකුගේ සහය ඇතිව සිදු කරනු ලබන අදහස් විමසීම් ක්‍රියාවලියකින් අවශ්‍යතාවයන් පදනම් කරගෙන මෙම අතුරු නීති හඳුනාගනු ලැබේ. බස්නාහිර පළාත් සභාවේ නිති නිලධාරීන්ගේ සහය සහිතව මෙම අතුරු නීති කෙටුම්පත් කරනු ඇත. | 2019 ඔක්තෝබර් | 2020 ජූනි |
| 4. බස්නාහිර පළාතේ පළාත් සභා මට්ටමින් “ප්‍රජා මණ්ඩල” ශක්තිමත් කිරීම සඳහා ව්‍යවස්ථාවක් සකසනු ඇත. | 2019 ජූලි | 2019 දෙසැම්බර් |
| 5. මෙම අත්දැකීම් අනෙකුත් ප්‍රාදේශීය සභා, නගර සභා හා මහනගර සභාවල ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා යාන්ත්‍රණයක් සකසනු ඇත. | 2020 ජූලි | 2020 සැප්තැම්බර් |

<table>
<tr><th colspan="3">සම්බන්ධීකරණ තොරතුරු</th></tr>
<tr><td colspan="2">ක්‍රියාත්මක කරන ආයතනයෙන් වගකිව යුතු පුද්ගලයාගේ නම</td><td>කේ ඒ සුභද්‍රා වල්පොල මිය</td></tr>
<tr><td colspan="2">තනතුරදෙපාර්තමේන්තුව ,</td><td>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පළාත් පාලන)</td></tr>
<tr><td colspan="2">විද්‍යුත් තැපැල් ලිපිනය හා දුරකථන අංකය</td><td>විද්‍යුත් තැපැල : saslg@pclg.gov.lk<br>ස්ථාවර දුරකථනය : 0112345971 ජංගම දුරකථනය : 0714114735</td></tr>
<tr><td rowspan="2">සම්බන්ධවන අනෙකුත් පාර්ශවයන්</td><td>රාජ්‍ය අංශයෙන් සම්බන්ධවන පාර්ශවයන්</td><td>බස්නාහිර පළාත් සභාව; පළාත් පාලන කොමසාරිස්; බස්නාහිර පළාතේ තෝරා ගත් ප්‍රාදේශීය සභා</td></tr>
<tr><td>සිවිල් සමාජයීය සංවිධාන , ,පුද්ගලික අංශය බහුපාර්ශවීය අංශ හා අනෙකුත් යාකාරී කමිටුක්‍රි</td><td>ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය, සිවිල් සංවිධාන, ප්‍රජාමූල සංවිධාන හා තොරාගත් පළාත් පාලන ප්‍රදේශවල පාර්ශවකරුවන්</td></tr>
</table>